# ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය

## පුරප්පාඩු

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් සහිත අයදුම්කරුවන්ගෙන් 2021.12.24 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ.

## 01. පූර්ණකාලීන නේවාසිකාගාර උපපාලක II ශ්‍රේණිය (පිරිමි)

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් | : | පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු වීම.<br>නේවාසිකාගාර පරිපාලනය හා කළමනාකරණය පිළිබඳ පළපුරුද්දක් ලබා ඇති අයදුම්කරුවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. |
| වයස | : | අයදුම්පත් බාරගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |
| තෝරා ගැනීම | : | සම්මුඛ පරීක්ෂණයක් පවත්වා බඳවා ගැනීම සිදු කරනු ලැබේ. |
| වැටුප් ක්‍රමය | : | UMN 3 (II) රු. 42,885 -18X660 - 54,765/= (මාසික) |

## 02. මහජන සෞඛ්‍ය පරීක්ෂක III ශ්‍රේණිය

| | | |
|---|---|---|
| අවශ්‍ය සුදුසුකම් (I) | : | සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මහජන සෞඛ්‍ය පරීක්ෂක විභාගය සමත්වීම. |
| වයස | : | අයදුම්පත් බාර ගන්නා අවසන් දිනට අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. |
| තෝරා ගැනීම | : | සම්මුඛ පරීක්ෂණයක් මගින් |
| වැටුප් පරිමාණය | : | UMT 1(IIIA) රු. 31,625 - 7X300 -10X355-37,275/= (මාසික) |
| සැලකිය යුතුය | : | රජයේ සේවයෙන් විශ්‍රාම ගිය සේවකයින් වැඩපැවරුම් පදනම මත හෝ කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම සඳහා සලකා බැලිය හැක. |

**සේවා කොන්දේසි**

01. මෙම තනතුරු ස්ථිරය. පත්වීම් වසර තුනක (03) ක පරිවාස කාලයකට යටත් වේ.
02. තෝරාගත් අපේක්ෂකයින් දැනට රජයේ දෙපාර්තමේන්තුවක සේවය කරන්නේ නම් ඔහුගේ / ඇයගේ නිදහස් කිරීම ලබා ගත යුත්තේ අදාළ පත්කිරීමේ අධිකාරිය හරහා ය.
03. රජයේ සේවකයින්ට විශ්වවිද්‍යාල සේවයේ සිටියදී විශ්‍රාම වැටුප් අයිතිවාසිකම් පවත්වා ගැනීමට අයිතියක් නැත.

**ප්‍රතිලාභ**

01. ඉහත වැටුපට අමතරව, රජයේ අනුමත දීමනා සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ජීවන වියදම් දීමනාව ද අදාළ කාර්යය මණ්ඩලයට ගෙවනු ලැබේ.
02. තෝරාගත් අයදුම්කරුවන් තම ඉපයීම්වලින් 10% ක් විශ්වවිද්‍යාලීය අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර විශ්වවිද්‍යාලය මගින් එකී ඉපයීම් වලින් 8% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලීය විශ්‍රාම වැටුපටද 7% කට සමාන මුදලක් විශ්වවිද්‍යාලීය අර්ථසාධක අරමුදලට බැර කරනු ඇත. එයට අමතරව 3% ක මුදලක් විශ්වවිද්‍යාලය විසින් සේවක භාරකාර අරමුදලට ද බැර කරනු ඇත.

**අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය**

අයදුම්පත් www.sab.ac.lk විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් හෝ සහකාර ලේඛකාධිකාරී/ අනධ්‍යයන ආයතන අංශය, සබරගමුව විශ්වවිද්‍යාලය, තැ.පෙ. 02, බෙලිහුල්ඔය වෙත 2021.12.17. දිනට පෙර සිය ලිපිනය ලියා මුද්දර ගැසූ 9"X4" ලිපි කවරයක් එවීමෙන් හෝ විශ්වවිද්‍යාලයේ අනධ්‍යයන ආයතන අංශය වෙත පැමිණ ලබාගත හැක.

නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් අදාළ සහතිකවල ඡායා පිටපත් සමග 2021.12.24 දිනට හෝ ඊට පෙර සහකාර ලේඛකාධිකාරී, අනධ්‍යයන/ ආයතන අංශය ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය තැ.පෙ. 02 බෙලිහුල්ඔය වෙත එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය.

විශ්වවිද්‍යාල සේවයේ රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩල/ අයදුම්කරුවන් ස්වකීය ආයතන ප්‍රධානියා මගින් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

අවශ්‍ය විස්තර සඳහන් කර නැති හෝ අපැහැදිලි හෝ ප්‍රමාද වී ලැබෙන හෝ අනෙකුත් නියමිත අවශ්‍යතාවයන් සපුරා නොමැති අයදුම්පත් කිසිදු හේතුවක් නොදක්වා ප්‍රතික්ෂේප කරන අතර, එවැනි අයදුම්පත් කිසිදු හේතුවක් නිසා යළි සලකා බලනු නොලැබේ.

**ලේඛකාධිකාරී,**
**ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය.**
**2021.12.06**

Source: Dinamina, Daily News (2021.12.07)